**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2013**
**------------------------------------------------------**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ගණකාධිකරණ ප්‍රතිපත්ති වෙනස්වීම ලෙස රු.366,000 ක් දක්වා තිබූ නමුත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් අධික මිලකට භාණ්ඩ හෝ සේවා සපයන බව හෝ, භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් යම් ආකාරයකට වෙළඳපොළ අයථා පරිදි භාවිත කිරීමක් හෝ වෙනත් යම් වෙළෙඳපොළ දෝෂයක් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, එය විමර්ශනය කර වාර්තා කිරීම සඳහා සභාව වෙත යොමු කළ යුතු වුවත්, ගෑස් මිල පහළ ගිය 2013 මාර්තු සිට ඔක්තෝබර් දක්වා කාල පරාසය තුළ එක් ගෑස් සමාගමක් විසින් අවස්ථා 04 කදී ගෑස් මිල අඩු නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු.32,816,755 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.6,765,819 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,050,936 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රතිපාදන ඉකුත් වර්ෂයට වඩා වැඩියෙන් ලැබීම විවිධ ආදායම් වැඩිවීම ස්ථාවර තැන්පතු සඳහා ලැබූ පොළී ආදායම වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපා තිබුණි. එමෙන්ම අධිකාරියේ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.208,702,621 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ දී එය රු.254,731,766 ක් වූයෙන් රු.46,029,145ක් එනම් සියයට 22 ක වියදම්වල වැඩිවීමක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු.4,970,000 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී තිබූ අතර අධිකාරිය විසින් වත්කම් මිලදී ගැනීම සඳහා රු. 6,221,843 ක් වැය කර තිබුණෙන් ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු. 1,251,843 ක් වියදම් දරා තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය 2012 ජූනි 18 දිනැති අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ළදරු කිරි ආහාර වෙනුවෙන් මිල පාලනයක් සඳහා මැදිහත් වී තිබුණද එම මිල පැනවීම සාධාරණ නොවන බව දන්වමින් අධිකාරියට විරුද්ධව එක් කිරිපිටි සමාගමක් නඩු පවරා තිබුණි.

(ආ) 2010 මහ මැතිවරණ කාල සීමාව තුළ කිසිඳු දැනුම් දීමකින් තොරව සේවයෙන් පහකර තිබූ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය එයට විරුද්ධව කම්කරු උසාවියේ නඩු පවරා තිබුණි. දෙපාර්ශවය විසින් නඩුව සමථයකට පත් කිරීමේදී අධිකාරිය විසින් ඒ සඳහා රු. 3,560,400 ක වන්දියක් අදාළ නිලධාරියාට ගෙවා නඩුව සමථයකට පත්කර ගෙන තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් පාඩුවක් සිදු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුකුළු මස් මිල වැඩි වීම

2013 මැයි 30 දිනැති අංක 1812/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සම සහිත බ්‍රොයිලර් කුකුළු මස් සඳහා පමණක් විකිණිය හැකි උපරිම මිලක් පනවා තිබුණද, සම ඉවත් කළ කොටස් වශයෙන් අලෙවි කරනු ලබන අනිකුත් කුකුළු මස් සඳහා එවැනි විකිණිය හැකි උපරිම මිලක් නියම කර නොතිබීම හේතුවෙන් එම කුකුළු මස් විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීමට අවස්ථාව සැලසී තිබුණි.

(ආ) කිරි පිටි මිල වැඩිවීම

(i) සම්පූර්ණ යොදය සහිත කිරි පිටි

පදනම් වර්ෂයේ ආනයනික කිරි පිටි මිල ඉහළ යාමත් සමඟ කිරි පිටි බෙදාහැරීමේ නියුතු සමාගම් සිය නිෂ්පාදනවල මිල ගණන් වැඩි කිරීමට කිහිප අවස්ථාවක අධිකාරියෙන් ලිඛිත ඉල්ලීමක් කර තිබූ නමුත් අධිකාරිය විසින් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. මෙකී ඉල්ලීම් ඉදිරිපත් කළ එක් සමාගමක් අධිකාරියේ ලිඛිත අවසරය ලබා නොගෙන 2013 ඔක්තෝබර් මාසයේ කිරි පිටි මිල වැඩි කර තිබූ අතර අධිකාරිය විසින් ඒ සඳහා පියවර ගැනීමට කටයුතු කිරීමේදී එකී සමාගම අධිකාරියට විරුද්ධව අභියාචනාධිකරණයේ නඩු පවරා තිබුණි. මේ සම්බන්ධව පනතේ 18(4) වගන්තිය ප්‍රකාරව අයදුම්පත ලැබී දින 30 ක් ඇතුළත තීරණයක් ලබාදීමට අධිකාරිය අපොහොසත් වීම මත මිල වැඩි කිරීමට සමාගමට හිමිකමක් ඇති බව නීතිපතිවරයා සඳහන් කර තිබුණි.

(ii) යොදය රහිත කිරි පිටි
------------------------

2003 අගෝස්තු 20 දිනැති අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර තිබූ නමුත් යොදය රහිත කිරි පිටි සඳහා අධිකාරිය විසින් පාලන මිලක් නියම කර නොතිබුණි. මේ හේතුව නිසා නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් අධිකාරියේ අවසර නොමැතිව තමන්ට අවශ්‍ය පරිදි කිරි පිටි මිල තීරණය කර තිබුණි.

(ඇ) තිරිඟු පිටි මිල තීරණය කිරීම
--------------------------------

2004 මැයි 23 දිනැති අංක 1342/1 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, තිරිඟු පිටි නිෂ්පාදනය කර බෙදා හැරීමේ කටයුතු කරන සමාගම් 02 ක් අධිකාරියේ අවසර නොලබා මිල වැඩිකිරීමට කටයුතු කර තිබූ නමුත් රජයේ නීතිපතිවරයා විසින් මෙම භාණ්ඩය පාරිභෝගික අධිකාරියේ 18 (2) වගන්තිය අනුව පාලනය වන්නක් බවත් මිල වැඩි කිරීමේදී අධිකාරියේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු බවත් දන්වා තිබූ නමුත් මෙම මිල පාලනය සම්බන්ධ අධිකාරියේ බලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල් පී) ගෑස් මිල තීරණය කිරීම
--------------------------------------------------------------

ගෑස් බෙදා හැරීමේ නිරත සමාගම් 02 ක පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමඟ ඇති කරගෙන ඇති ගිවිසුමට අනුව සෑම මාස 02 කට වරක් ගෑස් මිල සංශෝධනය සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එක් සමාගමක් 2013 වර්ෂය තුළ කිසිඳු මිල සංශෝධන ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි.

2013 වර්ෂය මැද භාගයේදී ලෝක වෙළඳපළේ ගෑස් මෙට්‍රික් ටොන් 01 ක මිල එක්සත් ජනපද ඩොලර් 955 සිට 762 දක්වා අඩු වුව ද, අදාල සමාගම මිල සංශෝධන ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් නොකිරීම නිසා ගෑස් මිල අඩු කිරීමට නොහැකි වී තිබුණි. ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් අධිකාරිය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) පානීය ජල බෝතල්
----------------------

2012 වර්ෂයේ අධිකාරිය විසින් කළ විමර්ෂණයකට අනුව ජල බෝතල් අනිවාර්ය තත්ත්ව පරීක්ෂාවකට යටත් විය යුතු බවත් පාරිභෝගිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ පාලනයට යටත් විය යුතු බවත් ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්ය බවත් පෙන්වාදී තිබුණි.

පනත මඟින් අධිකාරියට පැනවී ඇති බලතල ප්‍රයෝජනයට ගෙන ප්‍රමිතියෙන් හා මිල පාලනයෙන් තොරව පවතින මෙම කර්මාන්තය පාලනය කිරීමට කටයුතු සූදානම් කර වර්ෂ 02 කට ආසන්න කාලයක් ගත වී ඇතත් ඒ සඳහා නීති රීති නිකුත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් වතුර බෝතලයක සැපයුම් මිල හා සිල්ලර මිල අතර සියයට 25 සිට 60 ක ආන්තිකයක් යටතේ වෙළඳපළ මිල තීරණය වී තිබුණි.

(ඊ) පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය

පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් පාරිභෝගිකයින් වෙත දැනුම් දීම හා පාරිභෝගික පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම වෙනුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොතිබුණු බැවින් එය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය විසින් රු.5,590,834 ක් වැය කර තිබුණි.
මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය යටතේ පාරිභෝගික විමසුම් ලබා ගැනීම සඳහා රු.5,401,427 ක උපකරණ සවිකිරීමට ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබූ අතර අධිකාරියේ සභාපතිවරයා නිර්දේශ කළ සමාගම් කීපයක් අතරින් මිල ගණන් කැඳවා අමාත්‍යාංශ මිලදී ගැනීමේ කමිටුව විසින් එක් සමාගමකට පවරා තිබුණි.

(iii) ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් රු. 5,401,427 ක් වටිනා තාක්ෂණ උපකරණ අධිකාරියට අයත් පරිශ්‍රය තුළ සවිකර නොතිබුණි.

(iv) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 6.6 ක් වූ බැවින් එය අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2013 යල කන්නයේ වී මිල පහත වැටීම වළක්වාලීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DFD/Agri/PP-2013 Yala හා 2013 ජූලි 17 දිනැති ලිපිය මඟින් 2012/13 මහ කන්නයේ දිසාපතිවරුන් වෙත ලබාදුන් ප්‍රතිපාදන යටතේ මිලදීගත් වී තොග සත්ත්ව ආහාර ලෙස විකිණීමට නිර්දේශ කර තිබුණි. ඒ අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2008 වර්ෂයේ දී මිනිස් පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ පවතින සහල් හෝ වී සත්ත්ව ආහාර ලෙස භාවිතා කිරීම තහනම් කරමින් පනවා තිබූ නියෝගය 2013 ජූලි 29 දින අංක 1821/5 දරන ගැසට් නිවේදනයෙන් පරිච්ඡින්න කර තිබුණි. සත්ත්ව ආහාර ලෙස භාවිතා කිරීමට තීරණය කළ 2012/13 මහ කන්නයේ මිලදී ගත් මෙම වී තොග මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු ඉතා හොඳ තත්ත්වයේ පවතින බව වී අලෙවි මණ්ඩලයේ වී ගබඩා පරීක්ෂාවේදී අනාවරණය විය.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 370 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 275 ක් විය. ඒ අනුව තනතුරු 95 ක පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි. මේ අතර අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සංවර්ධන නිලධාරීන් 37 දෙනෙකු අධිකාරියට අනුයුක්ත කර තිබුණි.

(ආ) අධිකාරියේ මාධ්‍ය නිලධාරි තනතුරෙහි රාජකාරි කටයුතු කළ නිලධාරියෙකු 2013 මාර්තු 15 දින සිට අභ්‍යන්තර හා වෙළඳ කටයුතු අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම් ලෙස වැඩ භාරගෙන තිබියදීත් එම නිලධාරියාට 2013 ජූනි 30 දක්වා මාස 3 ½ ක කාලයක් සඳහා රු. 94,938 ක වැටුප් හා රු.17,084 ක සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් ද ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දුන් නියෝග ක්‍රියාත්මක කිරීම

2012 ඔක්තෝබර් 03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග 2013 දෙසැම්බර් 31 දිනට ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) අධිකාරියේ සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්කිරීමට කටයුතු කරන ලෙස අධිකාරියට නියෝග කර තිබුණ ද, 2013 දෙසැම්බර් 31 දිනට ද එය ක්‍රියාත්මක කර නොතිබුණි. ද්විතියික පදනම මත බඳවාගත් නිලධාරියෙකු එම තනතුරේ රාජකාරි කටයුතු ඉටුකරන බව නිරීක්ෂණය විය.

(ආ) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාහනයක් අළුත්වැඩියා කිරීම සහ ඊට වැය කරන ලද රු. 3,147,903 ක මුදල එකී අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර නොගැනීම සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස කරන ලද නියෝගය 2013 දෙසැම්බර් 31 දිනටද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) වත්කම් පාලනය
(ඈ) ව්‍යාපෘති පාලනය